# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1982 අංක 47 දරන
# තන්තෙයි චෙල්වා අනුස්මරණ භාරය (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ 1982 දෙසැම්බර් මස 30 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

1982 දෙසැම්බර් මස 31 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

මිළ : ශත 55 යි        තැපැල් ගාස්තුව : ශත 50 යි

# 1982 අංක 47 දරන තන්තෙයි චෙල්වා අනුස්මරණ භාරය (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1982 දෙසැම්බර් මස 30 වන දින]

එල්.ඩී.—ඕ. 39/82.

**තන්තෙයි චෙල්වා අනුස්මරණ භාරය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

*පූර්විකාව*

වැඩිදෙනා අතරේ "තන්තෙයි චෙල්වා" යනුවෙන් හඳුන්වනු ලබන මියගිය සැමුවෙල් ජේම්ස් වේලුපිල්ලේ චෙල්වනායගම් පිළිබඳ සමරණය අඛන්ඩව පවත්වා ගෙන යාම පිණිස, "තන්තෙයි චෙල්වා අනුස්මරණ සමාධි අරමුදල" සහ "තන්තෙයි චෙල්වා අධ්‍යාපනික අරමුදල" යනුවෙන් වෙන වෙනම වූ අරමුදල් දෙකකින් සමන්විත වන "තන්තෙයි චෙල්වා අනුස්මරණ භාරය" යනුවෙන් සඳහන් කරනු ලැබිය යුතු සහ හඳුන්වනු ලැබිය යුතු භාරයක්, ප්‍රසිද්ධ නොතාරිස් සී. වී. විවේකානන්දන් මහතා විසින් සහතික කරන ලද, 1980 මාර්තු මස 20 වන දින අංක 220/766 දරන භාර ඔප්පුවකින් පිහිටුවනු ලැබ ඇති හෙයින් ද:

එකී භාරයේ භාරකාර මණ්ඩලය විසින් එකී භාරය සංස්ථාගත කරන ලෙස ඉල්ලීමක් කරනු ලැබ ඇති හෙයින් සහ එකී ඉල්ලීම ඉටු කිරීම මහජන යහපත සඳහා ඉවහල් විය හැකි හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

*ලුහුඬු නාමය.*

1. මේ පනත 1982 අංක 47 දරන තන්තෙයි චෙල්වා අනුස්මරණ භාරය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

*තන්තෙයි චෙල්වා අනුස්මරණ භාරය සංස්ථාගත කිරීම.*

2. (1) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඒ දිනයෙන් පසුව, තන්තෙයි චෙල්වා අනුස්මරණ භාරය (මෙහි මින් මතු "භාරය" යනුවෙන් සඳහන් කරනු ලබන) "තන්තෙයි චෙල්වා අනුස්මරණ භාරය" යන නාමය සහිත සංස්ථාවක් විය යුතු ය.

(2) භාරයට, (1) වන උපවගන්තියෙන් ඊට දී ඇති නාමයෙන් සහ මෙහි සඳහන් කාර්ය සඳහා, අවිච්ඡින්න පැවැත්මක් තිබිය යුතු ය. සියලු අධිකරණවල දී භාරය විසින් එකී නාමයෙන් නඩු පවරනු ලැබිය හැකි අතර භාරයට විරුද්ධව එකී නාමයෙන් නඩු පවරනු ලැබිය හැකි ය. තවද, භාරයට පොදු මුද්‍රාවක් තිබිය යුතු අතර, ස්වකීය අභිමතය අනුව එය වෙනස් කිරීමට ද ඊට බලය තිබිය යුතු ය.

*භාරයේ පරමාර්ථය.*

3. භාරය සංස්ථාගත කරනු ලැබුවේ යම් පරමාර්ථයක් සඳහා ද ඒ පරමාර්ථය—

(1) (මෙහි මින් මතු "සමාධි අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන) තන්තෙයි චෙල්වා අනුස්මරණ සමාධි අරමුදල—

(අ) මියගිය නායක තන්තෙයි චෙල්වාට ගරු බුහුමන් කිරීමට මේ රටේ ජනතාවට සහ පිටරටින් මෙහි පැමිණෙන නෑනැත්තන්ට හැකි වන පිණිස ඉදි කරනු ලැබූ ස්මාරක කුළුණක් සහිතව සමාධිය නඩත්තු කිරීමේ සහ සංරක්ෂණය කිරීමේ; සහ

(ආ) අවශ්‍ය වන විටක හෝ භාරකාර මණ්ඩලය විසින් සුදුසු යයි සලකනු ලබන විටක හෝ කරනු ලබන යම් විශාල කිරීම්, එකතු කිරීම්, වෙනස් කිරීම් සහ අලුත් කිරීම් ද ඇතුළුව එකී සම්පත් යහපත් තත්ත්වයකින් පවත්වා ගෙන යාමේ

කාර්ය සඳහා උපයෝගී කර ගැනීම පිණිස ; හා

(2) (මෙහි මින් මතු "අධ්‍යාපනික අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන) තන්තෙයි චෙල්වා අධ්‍යාපනික අරමුදල සාමාන්‍යයෙන් අධ්‍යාපනික ප්‍රගතිය සඳහා සහ විශේෂයෙන්—

(අ) ශ්‍රී ලංකාව ඇතුළත සහ පිටරටවල පර්යේෂණ කටයුතුවල යෙදීම ද ඇතුළුව සුදුසු දෙමළ බස කථා කරන ජන කොට්ඨාසයට අයත් ශිෂ්‍යයන්ට තම අධ්‍යාපනය කර ගෙන යාම සඳහා ශිෂ්‍යත්ව, ණය, අත්තිකාරම් සහ වෙනත් ප්‍රදාන වශයෙන් මුදල් ආධාර සැලසීමේ ;

(ආ) මහජන සැලකිල්ල යොමු වී ඇති මාතෘකා සම්බන්ධයෙන් වර්ෂයකට වතාවක් හෝ දෙවතාවක් විශාරදයන් ලවා අනුස්මරණ දේශනා පැවැත්වීමේ ;

(ඇ) දෙමළ භාෂාව සහ දෙමළ සාහිත්‍යය විෂයයෙහි ලා ඉහත කී අනුස්මරණ දේශන පිළිබඳව ද දෙමළ බස කථා කරන ජනතාවගේ සමාජයීය, දේශපාලනමය, ඓතිහාසික සහ ආර්ථික සංවර්ධනය පිළිබඳව ද පොත්පත් පළකිරීමේ සහ තන්තෙයි චෙල්වාගේ සහ වෙනත් දෙමළ විද්වතුන් ගේ සහ නායකයින්ගේ චරිතෝපදාන සහ දේශනාදිය පළ කිරීමේ ;

(ඈ) දෙමළ භාෂාවෙන් වූ උසස් කෘත්‍යද දෙමළ බස කථා කරන ජනතාවගේ සමාජයීය, ආර්ථික, දේශපාලනමය සහ ඓතිහාසික සංවර්ධනය පිළිබඳ උසස් කෘත්‍යද තන්තෙයි චෙල්වාගේ සහ වෙනත් නායකයින්ගේ පොත්පත් ද තැබීම සඳහා පුස්තකාලයක් ගොඩනගා පිහිටුවීමේ ;

(ඉ) ග්‍රාම වර්ධනයට සහ ප්‍රජා සුභසාධනයට සම්බන්ධ සර්වෝදය කටයුතුවලට සහභාගිවීමෙන් සර්ව ව්‍යාප්ත සමාජ වෙනසක් සහ සිරිත් විරිත්, අගැයීම සහ සංකල්ප පිළිබඳ පූර්ණ පරිණාමයක් ඇති කිරීමට හැකිවන සේ සර්වෝදය තරුණ සේවා පිරිස් සංවිධානය කිරීමේ සහ පුහුණු කිරීමේ ;

(ඊ) දෙමළ බස කථා කරන ජනතාවගේ නූගත්කම මුලිනුපුටා දැමීම සඳහා වෘද්ධ අධ්‍යාපනය සැලසීමේ අදහසින් සන්ධ්‍යා පාසල් පිහිටුවීමේ සහ සංවිධානය කිරීමේ ; සහ

(උ) දෙමළ සංස්කෘතිය, දෙමළ භාෂාව, දෙමළ සාහිත්‍යය, දෙමළ බස කථා කරන ජනයාගේ ඓතිහාසික සහ සමාජ ආර්ථික වර්ධනය පිළිබඳ පර්යේෂණ අධ්‍යයන කටයුතු සහ සාමාන්‍ය යෙන් දෙමළ කථා කරන ජනයාට යහපතක් සැලසෙන ආකාරයේ යම් පර්යේෂණ කටයුතු සංවිධානය කිරීම පිණිස ශිෂ්‍යත්ව, ණය, අත්තිකාරම් සහ වෙනත් ප්‍රදාන වශයෙන් මුදල් ආධාර සැපයීමේ

කාර්ය සඳහා උපයෝගී කර ගැනීම පිණිස,

වෙනම වූ අරමුදල් දෙකක් ලෙස පරිපාලනය කිරීම, කළමනාකරණය කිරීම සහ පාලනය කිරීම ය.

4. (1) භාරය පිළිබඳ කටයුතු, මේ පනතට සහ ඒ යටතේ සාදන ලද රීතිවලට යටත්ව, මෙහි මින් මතු විධිවිධාන සලස්වා ඇති පරිදි සංස්ථාපිත සහ සාමාජිකයන් හත් දෙනකුගෙන් සමන්විත භාරකාර මණ්ඩලයක් විසින් පරිපාලනය කළ යුතු ය. භාරකාර මණ්ඩලය.

(2) ඉහත සඳහන් භාරකාර ඔප්පුවේ පාර්ශ්වකරුවන්ගෙන් සහ ඔවුන් විසින් තෝරා පත් කර ගනු ලැබූ සෙසු තුන් දෙනකුගෙන් ද සමන්විත වන සහ මේ පනත ක්‍රියාත්මක වන අවස්ථාවේ දී ධුර දරන භාරකාර මණ්ඩලය, මේ පනතේ කාර්යය සඳහා පළමුවන භාරකාර මණ්ඩලය විය යුතු ය.

(3) පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගේ සාමාන්‍ය බහුතරයක් විසින් භාරකාර මණ්ඩලයේ සභාපතිවරයා තෝරා පත් කර ගත යුතු ය.

(4) භාරකාර මණ්ඩලය විසින් තමන් අතුරෙන් මණ්ඩලයේ ලේකම්වරයා තෝරා පත් කර ගත යුතු ය. රැස්වීම් පිළිබඳ දැන්වීම් යැවීම, තමා විසින් මණ්ඩලයේ රැස්වීම් පිළිබඳ සියලු වාර්තා සටහන් කළ යුතු වාර්තා පොත් පවත්වා ගෙනයාම සහ කලින් කල මණ්ඩලය විසින් තමාට පවරනු ලබන කාර්ය හා කර්තව්‍ය ඉටු කිරීම සහ කිරීම ලේකම්වරයාගේ යුතුකම විය යුතු ය.

(5) භාරකාරයකුගේ ධුරය—

(අ) ඔහු මියගියහොත් හෝ අශක්‍යතාවකට පත්වී තිබේ නම්; හෝ

(ආ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක බලපවත්නා යම් නීතියක් යටතේ වුවත් හෝ වස්තු භංගත්වයට පත් තැනැත්තකු ලෙස ප්‍රකාශයට පත් කරන ලදුව, නිදහස නොලත් වුවත් තැනැත්තකු හෝ වස්තු භංගත්වයට පත් තැනැත්තකු නම්; හෝ

(ඇ) චරිත දූෂණය සම්බන්ධ වන වරදකට වරදකරු විණි නම්: හෝ

(ඇ) භාරකාරයකු ලෙස ක්‍රියා කිරීම පැහැර හැරියහොත්

හිස් වූ ලෙස සැලකිය යුතු ය.

(6) භාරකාර මණ්ඩලයේ ඇති වන පුරප්පාඩු ඉතිරි භාරකාරයන් විසින් කරනු ලබන පත්වීම් මගින් පිරවිය යුතු ය.

(7) භාරකාර මණ්ඩලය යටත් පිරිසෙයින් සෑම තුන් මසකට වරක්වත් රැස්විය යුතු ය.

(8) භාරකාර මණ්ඩලයේ සභාපතිවරයා, මණ්ඩලයේ යම් රැස්වීමකට පැමිණ සිටී නම්, ඔහු ඒ රැස්වීමේ මූලසුන දැරිය යුතු ය. යම් රැස්වීමකට සභාපතිවරයා පැමිණ නොමැති නම්, රැස්වීමකට පැමිණ සිටින සාමාජිකයන් විසින් තත්කාර්ය සඳහා තෝරා පත් කර ගනු ලබන මණ්ඩලයේ සාමාජිකයකු ඒ රැස්වීමේ මූලසුන දැරිය යුතු ය.

(9) භාරකාර මණ්ඩලයේ රැස්වීම්වල ගණපූරණය සාමාජිකයන් තුන් දෙනකු විය යුතු ය.

(10) භාරකාර මණ්ඩලයේ කිසිම ක්‍රියාවක් හෝ කටයුත්තක් මණ්ඩලයේ සාමාජිකත්වයේ යම් පුරප්පාඩුවක් තිබීමේ හේතුව නිසා ම පමණක් නිර්බල නොවිය යුතු ය.

(11) අන්‍යාකාර විධිවිධාන සලස්වා තිබෙන අවස්ථාවක හැර, මණ්ඩලයේ සෑම කරුණක් ම, පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් තීරණය කළ යුතු ය. එසේ වුවත් සමාන ඡන්ද ලැබුණ අවස්ථාවක සභාපතිවරයාට හෝ මුලසුන දරන සාමාජිකයාට, තම සාමාන්‍ය ඡන්දයට අමතරව, තීරක ඡන්දයක් ද තිබිය යුතු ය.

(12) වැටුප්, දීමනා හෝ සම්මාන මුදලක් වශයෙන් යම් පාරිශ්‍රමිකයක් ලැබීමට භාරකරුවන්ට හිමිකම නොතිබිය යුතු නමුත් තම කාර්යයන් ඉටු කිරීමේදී ඔවුන් විසින් දරනු ලබන වියදම් ආපසු ගෙවනු ලැබිය හැකි ය.

ගිණුම් සහ විගණනය.

5. (1) භාරයේ අය සහ වැය, වත්කම් සහ බැරකම් සහ වෙනත් සියලු ගණුදෙනු පිළිබඳව නිසි ගිණුම් පොත් තබා ගැනීමට භාරකාර මණ්ඩලය විසින් සැලැස්විය යුතු ය.

(2) සමාධි අරමුදලේ සහ අධ්‍යාපනික අරමුදලේ ගිණුම් වෙන් වෙන් වශයෙන් තබා ගත යුතු අතර එක් අරමුදලකින් අනෙක් අරමුදලට කිසිම ආකාරයකින් මුදලක් නොගෙවිය යුතු ය.

(3) භාරයේ ගිණුම් භාරකාර මණ්ඩලය විසින් පත් කරනු ලබන සුදුසුකම් ලත් විගණකවරයකු විසින් විගණනය කළ යුතු ය.

(4) භාරයේ මුදල් වර්ෂය මාර්තු මස 31 වන දිනයෙන් අවසන් වන ලිත් වර්ෂය විය යුතු ය.

රීති.

6. (1) භාරකාර මණ්ඩලය විසින් පහත දැක්වෙන සියලුම කරුණු සම්බන්ධයෙන් හෝ ඉන් කරුණු කිසිවක් සම්බන්ධයෙන් මේ පනතේ විධිවිධානවලට පටහැනි නොවන රීති මගා සහා රැස් වීමක දී පැමිණ ඡන්දය දෙන මණ්ඩලයේ සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු සංඛ්‍යාවකගේ තීරණයකින් කලින් කල සාදනු ලැබිය හැකිය :—

(අ) භාරකාර මණ්ඩලයේ ක්‍රියා කලාපය සහ කාර්ය සහ භාරයේ කටයුතු පිළිබඳව අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය ;

(ආ) භාරයේ සේවා නියුක්තිකයන්ගේ ක්‍රියා කලාපය, කාර්ය සහ කර්තව්‍ය ;

(ඇ) භාරයේ දේපළ පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම, බැංකු ගිණුම් විවෘත කිරීම සහ ඒ ගිණුම් ක්‍රියාත්මක කිරීම :

(ඈ) අරමුදල් ලබා ගැනීම සහ ත්‍යාග, ප්‍රදාන සහ පරිත්‍යාග එකතු කිරීම සහ භාර ගැනීම ; සහ

(ඉ) භාරයේ පරමාර්ථ සාක්ෂාත් කර ගැනීමට සම්බන්ධ හෝ ආනුෂංගික වෙනත් යම් කරුණක්.

එවැනි රීති සාදන ලද විට, එවැනිම රැස්වීමක දී සහ ඒවා සාදන ලද ආකාරයෙන් ම, ඒවා වෙනස් කිරීම, ඒවාට යමක් එකතු කිරීම, ඒවා සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකිය.

(ද) භාරකාර මණ්ඩලයේ සාමාජිකයෝ භාරයේ රීතිවලට යටත් වන් නාහ.

7. මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට සහ භාරයේ රීතිවලට යටත්ව,— දේපළ ආදිය දැරීමට ඇති බලය.

(අ) යම් මිල දී ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාග ලැබීමක්, උරුම වීමක් වශයෙන් හෝ අන්‍යාකාරයකින් භාරය වෙත සතු කරනු ලබන චංචල හෝ නිශ්චල යම් දේපළක් අත්කර ගැනීමේ සහ දැරීමේ ;

(ආ) භාරය විසින් සතු කර ගන්නා ලද, අත්කර ගන්නා ලද හෝ දරනු ලබන යම් ඉඩමක යම් ගොඩනැගිල්ලක් ඉදි කිරීමේ ; සහ

(ඇ) තම දේපළ අතුරින් කිසිවක් විකිණීමේ, ප්‍රදානය කිරීමේ, සමර්පණය කිරීමේ, පැවරීමේ හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමේ

නීත්‍යනුකූල ශක්‍යතාව භාරයට තිබිය යුතු ය :

එසේ වුවද, මණ්ඩලය විසින් සභා රැස්වීමකට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන් අතුරින් තුනෙන් දෙකකට නොඅඩු සංඛ්‍යාවක් විසින් ඒ රැස්වීමේ දී සම්මත කරනු ලබන යෝජනාවක් මගින් යම් නිශ්චල දේපළක් මිලට ගැනීමට හෝ බදු ගැනීමට තීරණය කරනු ලද අවස්ථාවක හැර, භාර අරමුදලට අයත් කිසිම මුදලක් එසේ නිශ්චල දේපළක් මිල දී ගැනීම සඳහා හෝ බදු ගැනීම සඳහා මණ්ඩලය විසින් නොයෙදවිය යුතු ය.

8. භාරයේ මුදල් ආණ්ඩුවේ සුරැකුම්පත්වල හෝ යාපනයේ මහා නගර සභාවේ පරිපාලන සීමාවන් ඇතුළත පිහිටි දේපළ පිළිබඳ මූල් උගස් සඳහා ආයෝජනය කිරීමට මණ්ඩලයට බලය තිබිය යුතු ය. භාරයේ මුදල් ආයෝජනය කිරීම.

9. භාරකාර මණ්ඩලයේ යෝජනාවක් මගින් විධිමත් ලෙස බලය පවරන ලද භාරකරුවන් දෙදෙනකු ඉදිරිපිට දී හැර කවර හෝ සාධන පත්‍රයකට භාරයේ මුද්‍රාව නොතැබිය යුතු අතර තමන් පැමිණි බවට සාක්ෂි වශයෙන් ඔවුන් විසින් එකී සාධන පත්‍රයෙහි තම නම් අත්සන් කළ යුතුය. තවද, එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමට බාහිරව විය යුතු ය. භාරයේ මුද්‍රාව තැබිය යුතු ආකාරය.

විසුරුවා හැරීමෙන් පසු ඉතිරිවන දේපළ.

**10.** භාරය විසුරුවා හැරි විට, සියලු ණය සහ බැරකම් පියවීමෙන් පසුව, (භාරයේ බැරට ඇති මුදල් ද ඇතුළුව) යම් දේපළක් ඉතිරිවී තිබේ නම්, ඒ දේපළ යාපනයේ මහා නගර සභාව වෙත සතු විය යුතු ය.

ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**11.** මේ පනතේ සඳහන් තැනැත්තන්ගේ හෝ ඔවුන් මගින්, ඔවුන්යෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් පාන තැනැත්තන්ගේ අයිතිවාසිකම්වලට හැර, ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙන යම් තැනැත්තන්ගේ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.